## ප්‍රවෘත්ති නිවේදනය

# ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2024 මාර්තු


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2024 මාර්තු මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 2.5%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2024 පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 5.1%ක් ලෙස වාර්තා විය. 2024 මාර්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 2.1% ක හා ආහාර නොවන කාණ්ඩයේ 0.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. ආහාර කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 මාර්තු මාසයේදී නොවෙනස්ව 2024 පෙබරවාරි මාසයේදී පැවති 5.0% අගයම වන අතර, ආහාර නොවන කාණ්ඩයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2024 පෙබරවාරි මාසයේදී 5.1% සිට 2024 මාර්තු මාසයේදී 0.7% දක්වා අඩු වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2024 පෙබරවාරි මාසයේ 214.5ක් වූ දර්ශකාංකය, 2024 මාර්තු මාසයේ දී 210.0 ක් දක්වා අඩු වී ඇති බව වාර්තා විය. මෙය 2024 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2024 මාර්තු මාසයේ දර්ශකාංකය 4.5ක අඩුවීමක් එනම් 2.06 ක ප්‍රතිශතාංක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම මාසික වෙනස්වීම සඳහා ආහාර කාණ්ඩය 0.95% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩය 1.12% කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ එළවළු, අමුමිරිස්, අලුත් මාළු, බිත්තර, පොල්, සීනි, වියළි මිරිස්, රතු ළූණු ,කරවල, සහල් සහ මිරිස් කුඩු යන ආහාර ද්‍රව්‍යවල වේ. එහෙත් ලොකු ළූණු, අලුත් පළතුරු, අර්තාපල්, කිරිපිටි, ඉඟුරු, කුකුලු මස්, තේ කුඩු/කොළ, මුං ඇට, යෝගට් සහ කහ කුඩු යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කළ විට, 2024 මාර්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය අඩුවීම සඳහා 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(විදුලි බිල)* සහ 'රෙදිපිළි සහ පාවහන්' (රෙදිපිළි), යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එහෙත් 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ සහ මත්ද්‍රව්‍ය' සහ 'ආපන ශාලා සහ හෝටල්' කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත. තව දුරටත් සළකා බැලීමේදී 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'අධ්‍යාපනය' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. මේ අතර 'ප්‍රවාහන' සහ 'විවිධ භාණ්ඩ සහ සේවා' කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි ඉතා සුළු අඩුවීමක් වාර්තා වී ඇත. තවද මේ අතර 'සෞඛ්‍ය', 'සංනිවේදන', 'විනෝදාත්මක සහ සංස්කෘතික' යන කාණ්ඩ වලට අයත් අයිතමයන්ගේ මිල මාර්තු මාසය පුරා නොවෙනස්ව පැවති බවත් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2024 පෙබරවාරි මාසයේ 2.7% සිට 2024 මාර්තු මාසයේදී 3.4% දක්වා වැඩිවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2023 | මාර්තු | 204.8 | 223.2 | 193.0 | 188.1 | 0.3 | -0.7 | 49.2 | 42.3 | 54.9 | 44.2 |
| | අප්‍රේල් | 202.7 | 223.8 | 189.1 | 188.2 | -1.0 | 0.1 | 33.6 | 27.1 | 39.0 | 31.8 |
| | මැයි | 203.1 | 226.1 | 188.3 | 187.8 | 0.2 | -0.2 | 22.1 | 15.8 | 27.6 | 21.6 |
| | ජූනි | 203.3 | 228.4 | 187.1 | 186.5 | 0.1 | -0.7 | 10.8 | 2.5 | 18.3 | 11.3 |
| | ජූලි | 201.9 | 227.5 | 185.3 | 188.0 | -0.7 | 0.8 | 4.6 | -2.5 | 10.9 | 6.3 |
| | අගෝ. | 201.9 | 224.6 | 187.3 | 188.7 | 0.0 | 0.4 | 2.1 | -5.4 | 9.0 | 4.1 |
| | සැප්. | 203.5 | 226.7 | 188.5 | 189.0 | 0.8 | 0.2 | 0.8 | -5.2 | 5.9 | 1.7 |
| | ඔක්. | 203.6 | 224.1 | 190.4 | 189.2 | 0.0 | 0.1 | 1.0 | -5.2 | 6.3 | 0.6 |
| | නොවැ. | 206.0 | 228.1 | 191.8 | 189.3 | 1.2 | 0.1 | 2.8 | -2.2 | 7.1 | 0.8 |
| | දෙසැ. | 208.8 | 236.2 | 191.2 | 189.7 | 1.4 | 0.2 | 4.2 | 1.6 | 6.3 | 0.9 |
| 2024 | ජන. | 215.0 | 242.4 | 197.3 | 193.9 | 3.0 | 2.2 | 6.5 | 4.1 | 8.5 | 2.2 |
| | පෙබ. | 214.5 | 239.5 | 198.3 | 194.6 | -0.2 | 0.4 | 5.1 | 5.0 | 5.1 | 2.7 |
| | මාර්තු | 210.0 | 234.4 | 194.3 | 194.5 | -2.1 | -0.1 | 2.5 | 5.0 | 0.7 | 3.4 |